# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2015/49 - 2017 අප්‍රේල් මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2017.04.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/22/30/2009

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.06.08 දිනැති හා අංක 1761/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2012.05.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අනුරාධපුරය, සාලියපුර, වතුර ටැංකිය පාර, නො. 11/1 හි පදිංචි එම්. ඩබ්. සරත් කීර්තිනාම මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.03.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2017 අප්‍රේල් මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

### කාර්මික අධිකරණයේ දී ය.

එම්. ඩබ්ලිව්. සරත් කීර්තිනාම,
නො. 11/1,
වතුර ටැංකිය පාර, සාලියපුර,
අනුරාධපුරය.

නඩු අංකය : ඒ 3453

හා

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
නො. 200, කිරුළ පාර,
කොළඹ 05.

### ප්‍රදානයයි

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර ආරාවුල බේරුම් කිරීම සඳහා 2012.05.10 වන දින මා වෙත යොමු කරන ලදී.

ඉහත කී පාර්ශ්වයන් දෙක අතර කාර්මික ආරාවුලට හේතුවී ඇති කාරණය වන්නේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ අනුරාධපුර ඩිපෝවේ පළමු පන්තියේ කාර්මික රියදුරෙකු ලෙස සේවය කළ එම්. ඩබ්ලිව්. සරත් කීර්තිනාම මහතාට 2004.09.02 දිනැතිව ලබාදී ඇති විනය පරීක්ෂණ අභියාචන නියෝගය පරිදි ඔහුගේ සේවය අත්හිටුවා තිබූ 2002.08.07 දින සිට 2003.10.01 දින දක්වා වූ කාල සීමාවට අදාළ වැටුප් අහිමි කිරීමෙන් ඔහුට යම් අගතියක් සිදු විනිද එසේ වූයේ නම් කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳවය.

දෙපාර්ශ්වය විසින් අදාළ සැළකිරීම් ලිඛිතව ඉදිරිපත් කිරීමෙන් පසු 2013.05.31 වන දින විභාගය ආරම්භ කරන ලදී. ඉන්පසු දින කිහිපයක් මෙම නඩුව විභාග කිරීමෙන් පසු වැඩිදුර විභාගය සඳහා 2017.02.21 වන දින මෙම නඩුව කැඳවන ලදී. එදින ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටි නියෝජිත මහතා ප්‍රකාශ කර සිටියේ ඉල්ලුම්කරු කැමැත්තෙන් විශ්‍රාම යාම සඳහා ඉල්ලීමක් කර ඇති බවත්, එසේ විශ්‍රාම යාම සඳහා කාර්මික අධිකරණයට ඉදිරිපත් කර ඇති මෙම ඉල්ලීම බාධාවක් වී ඇති නිසා මෙම නඩුව ඉල්ලා අස්කර ගැනීමට ඉල්ලා සිටින බවයි. එසේම මෙම කරුණ සම්බන්ධයෙන් මෙම අධිකරණයට නැවත ඉල්ලීමක් නොකරන බව ඉල්ලුම්කරු වෙනුවෙන් දැනුම් දෙන ලදී. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥවරියද මෙම ඉල්ලීම

1 A – G 25444 — 28 (2017/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටියේ මෙම කරුණ සම්බන්ධයෙන් නැවත ඉල්ලීමක් නොකරන්නේ නම් මෙම ඉල්ලා අස්කර ගැනීමට විරුද්ධ නොවන බවයි. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීමට ඉඩදී මෙම නඩුවේ කටයුතු අවසන් කරන ලදී. මා වෙත යොමු කරන ලද කාර්මික ආරාවුලට හේතුවූ කාරණය සම්බන්ධයෙන් තීරණයක් නොකරන අතර, ප්‍රදානයක් ද නියම නොකරමි.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2017 මාර්තු මස 03 වැනි දින.

05 - 121

---

මගේ අංක : IR/13/21/2011

## කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.02.12 දිනැති හා අංක 1797/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.01.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් උණවටුන, ඉලුක්පිටිය, නො. 71 හි පදිංචි බී. ජී. සුසිරිපාල මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.02.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2017 අප්‍රේල් මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

### කාර්මික අධිකරණයේ දී ය.

බී. ජී. සුසිරිපාල,
නො. 71, ඉලුක්පිටිය,
උණවටුන.

නඩු අංකය : ඒ 3497 ඉල්ලුම්කරු

එදිරිව

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක. 200, කිරුළ පාර,
කොළඹ 05.

### ප්‍රදානයයි

1957 අංක 14 හා 1952 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ගිංතොට වැඩපළේ vi ශ්‍රේණියේ පෝමන්වරයෙකු වූ බී. ජී. සුසිරිපාල මහතා හා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා 2013.01.18 දින මා වෙත යොමු කරන ලදී.

දෙපාර්ශ්වය විසින් අදාළ ලේඛන ගොනු කිරීමෙන් පසු මෙම නඩුව මා ඉදිරියේදී විභාගයට ගන්නා ලදී. පැමිණිලිකාර බී. ජී. සුසිරිපාල මහතාගේ ඉල්ලීම වන්නේ තමා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ගිංතොට ප්‍රාදේශීය වැඩපළේ vi ශ්‍රේණියේ පෝමන්වරයෙකු වශයෙන් කටයුතු කරමින් සිටියදී ශ්‍රී ලංගම කි. අ 66/17/2005 හා 05.01.21 දිනැති කමිටු වාර්තාවේ නිර්දේශ අනුව වැඩබලන සේවක මණ්ඩල කළමනාකාරිනියගේ ශ්‍රී ලංගම/සේ ම කො/විධා/2004 (1) හා 2005.02.11 දිනැති ලිපිය මගින් 2005.01.03 දින සිට iv ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරකට උසස් කර ඇති බවත් එම උසස්වීමේ ලිපිය ගිංතොට වැඩපළේ කර්මාන්ත ඉංජිනේරු කාර්යාලයට යවා ඇති බවත්ය. ඒ බව දැන ගත්තේ වසර හතරකට පමණ පසුව එනම් 2009.08.07 දින හෝ ඊට ආසන්න දිනයකදී බවත් ය. නඩු විභාගයේ දී එම ලිපිය ඒ 1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම එම ලිපිය ගිංතොට ප්‍රාදේශීය වැඩපළ වෙත ලැබී ඇති බව එහි සඳහන් දින මුද්‍රාවෙන් පැහැදිලි වන බවද පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියේය.

අනතුරුව ඉල්ලුම්කරු එම උසස්වීමේ ලිපිය ප්‍රාදේශීය වැඩපළේ ඉංජිනේරු ඩබ්. යූ. ද සිල්වා මහතා වෙත ඉදිරිපත් කර කරුණු විමසා ඇති අතර, ඔහු ප්‍රකාශ කර ඇත්තේ, එම ලිපිය අනුව කටයුතු කිරීමට ශ්‍රී ලංගම මානව සම්පත් කළමනාකරුගේ උපදෙස් පැතිය යුතු බවය. ඒ අනුව ප්‍රාදේශීය වැඩපළේ කාර්මික ඉංජිනේරුවරයා ශ්‍රී ලංගම මානව සම්පත් කළමනාකරු වෙත උපදෙස් පතා 2009.08.07 දින ලිපියක් යවා ඇති අතර එම ලිපියේ පිටපතක් ඒ 2 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලිපියට මානව සම්පත් කළමනාකරුගෙන් පිළිතුරක් ලැබී නැත. අනතුරුව ඉල්ලුම්කරු භාරකාර ඉංජිනේරු (ප්‍රා.වැ. ගිංතොට) මගින් ශ්‍රී ලංගම නි. සාමාන්‍යාධිකාරී (පාලන) වෙත උසස්වීම් ලිපියට අනුව සේවයෙහි පිහිටුවන ලෙස ඉල්ලීමක් කර ඇත. එම ලිපියටද පිළිතුරක් නොලැබුණ නිසා ඉල්ලුම්කරු ශ්‍රී ලංගම සභාපතිවරයාටද මෙම කරුණු ලිපියකින් දන්වා ඇති අතර සභාපතිවරයා නිර්දේශ සඳහා යනුවෙන් සඳහන් කර එම ලිපිය ප්‍රධාන මානව සම්පත් කළමනාකරු වෙත යොමු කරන ලද බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටියේ ය. එසේ ඉදිරිපත් කරන ලද ලිපිවල ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රතිචාරයක් නොලැබුණු නිසා ඉල්ලුම්කරු ගාල්ල සහකාර කම්කරු කොමසාරිස් වෙත පැමිණිල්ලක් කර ඇත.

කම්කරු කොමසාරිස්වරයා මෙම කරුණ පිළිබඳව පරීක්ෂණයට පැමිණෙන ලෙස දින කිහිපයක්ම ශ්‍රී ලංගම මානව සම්පත් කළමනාකරු වෙතත් ගිංතොට ප්‍රාදේශීය වැඩපළේ කාර්මික ඉංජිනේරුවරයා වෙතත් දැනුම්දී ඇත. එකී කැඳවීම් ලිපිවල පිටපත් A3, A3A, A3B, A3C ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංගම වෙනුවෙන් ගිංතොට වැඩපළේ කාර්මික ඉංජිනේරුවරයා එම පරීක්ෂණයට සහභාගි වී ඇති අතර ඔහු සඳහන් කර ඇත්තේ මේ පිළිබඳව ශ්‍රී ලංගම ඉහළ බලධාරීන් මේ පිළිබඳව දැනුවත් කළද ප්‍රතිචාරයක් නොදක්වූ බවය. ගිංතොට ප්‍රාදේශීය වැඩපළේ කර්මාන්ත

ඉංජිනේරුවරයා 2010.10.11 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වෙත යවන ලද වාර්තාවේ ද මෙසේ සඳහන් කර ඇත.

07 අදාළ පරීක්ෂණයේ සඳහන් කම්කරු කොමසාරිස් ගාල්ල තැන මා කැඳවූ අතර ඒ සම්බන්ධයෙන් මවිසින් ශ්‍රී ලංගම ප්‍රධාන මානව සම්පත් කළමනාකර තැන දැනුවත් කළ නමුත් ඒ සඳහා නිසි ප්‍රතිචාරයක් නොලැබුණි. දින 03 ක් කම්කරු කොමසාරිස්තුමා ඉදිරියේ පෙනී සිටි මා බී. ජී. සුසිරිපාල මහතාගේ පැමිණිල්ල සම්බන්ධයෙන් මාහට සෘජු තීරණයක් ලබාදීමට නොහැකි බවත් ශ්‍රී ලංගම ප්‍රධාන මානව සම්පත් කළමනාකර මහතාගේ පිළිතුරක් ලැබී නොමැති බවත් දන්වා සිටින ලදී.

ගිංතොට ප්‍රාදේශීය වැඩපළේ කාර්මික ඉංජිනේරුවරයා ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් ගාල්ල කම්කරු කාර්යාලයේ කැඳවීම අනුව අදාළ පරීක්ෂණයට සහභාගිවීමෙන් පසුව 2010.10.08 වන දින ශ්‍රී ලංගම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා එම ඉංජිනේරුවරයාට දුරකථන ඇමතුමක් දී සුසිරිපාල මහතාගේ උසස්වීම පිළිබඳව කරුණු විමසා ඇත. ගිංතොට ප්‍රාදේශීය වැඩපළේ කාර්මික ඉංජිනේරුවරයා 2010.10.11 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (කාර්මික) වෙත උසස්වීමේ ලිපිය අනුව සේවයෙහි පිහිටුවන ලෙස ඉල්ලීම/බී. ජී. සුසිරිපාල මහතා පෝමන් vi ශ්‍රේණියේ මාගේ අංක මැයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාවේ මේ කරුණට අදාළ සම්පූර්ණ විස්තරයක්ද උසස්වීම් ලිපිය පිළිබඳ නිරීක්ෂණ කිහිපයක්ද අඩංගු කර ඇත.

කරුණු එසේ තිබියදී දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය 2013.05.07 වන දින කාර්මික අධිකරණයට සිය පළමු ප්‍රකාශය ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ.

(3) මෙම නඩුවේ ඉල්ලුම්කාර බී. ජී. සුසිරිපාල මහතාට ඔහු විසින් ඉල්ලා සිටින පරිදි iv ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරක් ලබා දීම සම්බන්ධ පත්වීම් ලිපියක් හෝ ඉල්ලුම්කරු සඳහන් කරන ආකාරයට එවැනි පත්වීම් ලිපියක් ලබාදීමට අදාළ වෙනත් ලේඛනයක් ඉල්ලුම්කරුගේ පුද්ගලික ලිපි ගොනුවේ නොමැති බව ප්‍රකාශ කර සිටි යනුවෙනි.

වගඋත්තරකාර පාර්ශ්වය එසේ ප්‍රකාශ කළද ගිංතොට වැඩපළේ කාර්මික ඉංජිනේරුවරයා අංක E/09/17 හා 2009.08.07 වන දින මානව සම්පත් කළමනාකරු වෙත යවන ලද ලිපිය ඉල්ලුම්කරු ප්‍රාදේශීය වැඩපළේ භාරකාර ඉංජිනේරු මගින් 2009.09.15 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) වෙත යවන ලද ලිපිය ගිංතොට වැඩපළේ කාර්මික ඉංජිනේරුවරයා විසින් අංක E/10/17 හා 2010.10.11 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කාර්මික) වෙත යවන ලද වාර්තාව ගාල්ල දිස්ත්‍රික් කම්කරු කොමසාරිස් පරීක්ෂණයක් සඳහා කැඳවමින් ශ්‍රී ලංගම ප්‍රධාන මානව සම්පත් කළමනාකරු වෙත යවන ලද කැඳවීම් ලිපි (එම ලිපිවල පිටපත් A3, A3A, A3B, A3C ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී) ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන ගිය බී. ජී. සුසිරිපාල මහතාගේ පුද්ගලික ලිපි ගොනුවේ හෝ ඊට අදාළ වෙනත් ලිපි ගොනුවක හෝ තිබිය යුතු ලේඛන වේ. කරුණු එසේ වුවද සුසිරිපාල මහතාගේ පුද්ගලික ලිපි ගොනුවේ අදාළ පත්වීම් ලිපිය හෝ ඊට අදාළ වෙනත් ලේඛන නොමැති බවද දෙවන පාර්ශ්වය විසින් කර ඇති ප්‍රකාශය වගකීම් විරහිත ප්‍රකාශයකි.

ඊළඟට මා විසින් අවධානය යොමු කරන ලද වැදගත් කරුණක් වන්නේ A1 ලෙස ලකුණු කරන ලද උසස්වීම් ලිපිය සත්‍ය ලේඛනයක්ද නැද්ද යන්නයි. ඒ සම්බන්ධයෙන් පැමිණිල්ල විසින් සාක්ෂියට කැඳවන ලද එස්. යූ. ආර්. වනිගසේකර මහත්මියගේ සාක්ෂියේදී උසස්වීමේ ලිපියේ අත්සන් තබා ඇත්තේ එම මහත්මිය බව එම ලේඛන පෙන්වමින් ඇයගෙන් ප්‍රශ්න කළ අවස්ථාවේදී පිළිගත්තාය.

A1 ලේඛනය පෙන්වමින්

එය ගිංතොට ප්‍රාදේශීය වැඩපළේ බී. ජී. සුසිරිපාල මහතාට නිකුත් කළ උසස්වීමේ ලිපිය බව පිළිගනී.

ප්‍ර : A1 ලිපියේ අත්සන වැඩ බලන සේවක කළමනාකරු කියන තනතුරට අදාළව අත්සන් තබා ඇත්තේ කවුද ?

උ : මගේ අත්සන

ප්‍ර : මේ අත්සනට පහළින් මුද්‍රාවක් තබා තිබෙනවා එය පාවිච්චි කලේ කවුද ?

උ : මම

වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න ඇසුවේද නැත. එම උසස්වීමේ ලිපියට අත්සන් තබන ලද සේවක මණ්ඩල කළමනාකරණ උසස්වීම් ලිපිය හඳුනා ගැනීමෙන් තහවුරු වන්නේ එම ලිපිය සත්‍ය ලේඛනයක් බවයි. තවද එම ලිපිය සම්බන්ධයෙන් ගිංතොට ප්‍රාදේශීය වැඩපළේ කාර්මික ඉංජිනේරු තැන විසින් ශ්‍රී ලංගම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වෙත යවන ලද වාර්තාවේද එම ලිපිය පිළිබඳ නිරීක්ෂණද සැලකිල්ලට ගතිමි. එහි මෙසේ සඳහන් වේ.

i. 2005.01.03 දින සිට විධායක ශ්‍රේණියේ උසස්වීම් ලැබ අනිකුත් නිලධාරි මහත්ම/මහත්මීන්ට නිකුත් කර ඇති උසස්වීම් ලිපිවල යොමු අංකයන් හා දිනයන්ද

ii. වැඩ බලන සේවක මණ්ඩල කළමනාකාර තැන ශ්‍රී ලංගම විසින් සියලු උසස්වීම් ලිපිවල තබා ඇති අත්සන්ද

iii. සියලුම උසස්වීම් ලිපිවල තබා ඇති රබර් මුද්‍රාවන්ද

iv. සියලුම උසස්වීම් ලිපිවල ආකෘතින්ද බී. ජී. සුසිරිපාල මහතා විසින් මා වෙත ඉදිරිපත් කරන ලද උසස්වීම් ලිපියේ මුල් පිටපත හා සැසදෙන බව දන්වමි.

ඉහත සාධක සියල්ල සැලකිල්ලට ගෙන ඉල්ලුම්කාර බී. ජී. සුසිරිපාල මහතා iv ශ්‍රේණියේ ඉංජිනේරු තනතුරට උසස් කරන ලද ලිපිය ශ්‍රී ලංගම වැඩ බලන සේවක කළමනාකාරිය විසින් අත්සන් තබා ගිංතොට ප්‍රාදේශීය වැඩපළේ ඉංජිනේරු වෙත යවන ලද ලිපියක් බව තීරණය කරමි.

ඉල්ලුම්කාර බී. ජී. සුසිරිපාල මහතාට 2005.02.11 වන දින සිට අදාළ උසස්වීම් ලබා නොදීම හේතු කරගෙන ඔහුට වූ මූල්‍ය පාඩුව ගණනය කර ඉල්ලුම්කාර පාර්ශ්වය සිය ලිඛිත දේශනය සමග ලේඛනයක් ඉදිරිපත් කර ඇත. එකී ලේඛනයේ මූලික වැටුප සහ ඊට සාපේක්ෂව ලැබිය යුතු දීමනාවන්ද ඇතුළත්ව රුපියල් තුන් ලක්ෂ තිස් හත් දහස් නමසිය හතලිස් නමයයි ශත පනස් හතක

(රු.3,37,949.57) මුදලක්ද, අහිමි වූ තුන් මාසයක වැටුප ලෙස රුපියල් හැට පන් දහස් දෙසිය විස්සක (රු. 65,220/) මුදලක්ද, සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාර අරමුදලේ දායකත්වය වෙනුවෙන් රුපියල් හතලිස් හතරදහස් හත්සිය විසි හතරක (44,724/) මුදලක්ද විශ්‍රාම පාරිතෝෂිකය අහිමිවීම වෙනුවෙන් රුපියල් දෙලක්ෂ හැත්ත එක් දහස් පන්සිය හැට තුනක (2,71,563/) මුදලක් වශයෙන් ආදී වශයෙන් හත් ලක්ෂ දහ නම දහස් හාරසිය පනස් හතයි ශත නමයක (රු. 7,19,457.09) මුදලක් ඉල්ලුම්කරුට ලැබිය යුතු බව සඳහන් කර ඇත. ඒ ආකාරයට සිදු කර ඇති ගණනය කිරීම් පිළිගත නොහැකිය. උදාහරණ ලෙස විශ්‍රාම අහිමිවීමට අදාළ මුදල ගණනය කර ඇත්තේ මුල් පත්වීමේ දිනය වූ 1974.05.02 දා සිට සේවය අවසන් කළ දිනය වූ 2016.04.17 දින දක්වා අවුරුදු 41 ක් සඳහාය. ඉල්ලුම්කරුගේ මෙම ඉල්ලීමේදී සලකා බැලිය යුත්තේ 2005 වසරේ සිට සිදුවූ මූල්‍ය පාඩුව පමණි. ඒ අනුව පැමිණිල්ල විසින් යෝජනා කර ඇති හත් ලක්ෂ දහ නම දහස් හාරසිය පනස් හතයි ශත නමයක (රු. 7,19,457.09) ක මුදල ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරමි. එසේ වුවද වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය 2005 වසරේදී ඉල්ලුම්කරුට උසස්වීම් ලබාදීම හිතාමතාම මගහැර හෝ නොසලකා හැර ඇති බව ඉහත සඳහන් කරුණු අනුව තහවුරු වන නිසා ඉල්ලුම්කරුට අසාධාරණයක් හා අයුක්තියක් සිදුව ඇති බව නිගමනය කරමි. ඉහත කරුණු සියල්ල සලකා බලා ඉල්ලුම්කරුට රුපියල් ලක්ෂ හතරක (රු. 4,00,000/) මුදලක් ප්‍රදානය කිරීමට තීරණය කරමි. තවද මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළවී මසක් ඇතුළත වගඋත්තරකාර ගමනා ගමන මණ්ඩලය විසින් ගෙවිය යුතු බවටද තීරණය කරමි. ප්‍රදානය කරන ලද මුදල නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු වේ.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2017 පෙබරවාරි මස 03 වැනි දින.

05 - 122

---

*මගේ අංක* : IR/09/01/2007

## කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.01.12 වැනි දිනැති හා අංක 1949/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.12.31 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රාගම, වල්පොල, අංක 332බී. හි පදිංචි බී. විශාඛා රණතුංග මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කම්කරු මහලේකම් කාර්යාලය, 1 වන මහල හි පිහිටි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.01.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2017 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*මගේ අංකය* : IR/09/01/2007

### කාර්මික අධිකරණයේ දී ය.

බී. විශාඛා රණතුංග මිය,
නො. 167,
''වාසනා'',
වීරරත්න මාවත,
වල්පොල,
රාගම.

*එක් පාර්ශ්වයක් වශයෙන්*

නඩු අංකය : ඒ 3616 සහ

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය,
01 වන මහල,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

*අනෙක් පාර්ශ්වයක් වශයෙන්*

අතර පවත්නා කාර්මික ආරාවුල පිළිබඳවයි

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන ඔහු 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :

''සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ V වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ සාමාන්‍ය සේවා සහකාර තනතුරේ සේවය කළ බී. විශාඛා රණතුංග මහත්මිය විසින්,

01. 1996.07.25 දිනැති අංක HR/41 දරන චක්‍රලේඛය අනුව 1998.11.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි V වන ශ්‍රේණියට උසස් කිරීම පෙරදාතම් කිරීමට.
02. 2002.07.31 දින සිට IV වන ශ්‍රේණියේ තනතුරකට පත් කිරීමට.
03. 2002.02.28 දිනැති චක්‍රලේඛය අනුව Customer Services Co-ordinator - Grade III (New Post) තනතුරට පත් කිරීමට.

කරනු ලබන ඉල්ලීම යුක්තිසහගතද යන්න හා එලෙස යුක්තිසහගත වන්නේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ. ''

පෙනී සිටීම මෙසේ ය.

පළමු වන පාර්ශ්වයේ නියෝජිත ශ්‍රේෂන් සිල්වා මහතා නියෝජනය කරයි.

පළමු වන පාර්ශ්වකාරිය බී. විශාඛා රණතුංග මහත්මිය පැමිණ සිටියි.

දෙවන පාර්ශ්වය වන නීතිඥ සුසන්ත ගුණසේකර මහතා සමඟ සහකාර සාමාන්‍ය අධිකාරී පිරිස් හා පරිපාලන නීතිඥ සමන්මලී රූපසිංහ මහත්මිය පැමිණ සිටියි.

පාර්ශ්වයන් විසින් විධිමත් ලෙස ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2016.11.09 වැනි දින විභාගය ආරම්භ කරන ලද අතර මගේ නියමය පරිදි පළමුවන පාර්ශ්වය විසින් නඩුව ආරම්භ කරමින් පාර්ශ්වයන් දෙදෙනාම ලිඛිත සැලකිරීම් භාර දී ඇත.

මේ ආරාවුලට පසුබිම් වූ හේතුව දක්වා ඇත්තේ දෙවන පාර්ශ්වකරු විසින් බව දක්විය යුතුය. එනම් ''කිසිදු පුද්ගලයෙකුට එකම නිමිත්ත සම්බන්ධයෙන් සහන පතා එකම අවස්ථාවකදී පරීක්ෂණ දෙකක් සඳහා ඉල්ලුම් කර පෙනී සිටිය නොහැකි'' බව (Non bis in idem - not twice for the same thing) පිළිගත් නීති සිද්ධාන්තයක් වේ. මේ සම්බන්ධව ප්‍රාථමික නියෝගයක් ද 2016.05.30 වැනි දින ලබා දී ඇත.

පළමුවන පාර්ශ්වකරුගේ පළමුවන සහ දෙවන ප්‍රකාශය ද, දෙවන පාර්ශවකරුගේ පළමුවන සහ දෙවන ප්‍රකාශයද ඊට පසු භාර දී ඇති අතර ලිඛිත දේශන ද පරීක්ෂා කර බලන අවස්ථාවේදී විසඳිය යුතු කරුණු නම් පළමුවන පාර්ශ්වකරු මහජන පෙත්සම් කාරක සභා කාර්යාලයට ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය සහ ඊට අදාල තීරණය සම්බන්ධව සැලකිය යුතු ය.

2015.12.31 වන දින මා හට යොමු කරන ලද කරුණු

01. 1996.07.25 දිනැති අංක HR/41 දරන චක්‍රලේඛය අනුව 1998.11.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි V වන ශ්‍රේණියට උසස් කිරීම පෙරදාතම් කිරීමට.

02. 2002.07.31 දින සිට IV වන ශ්‍රේණියේ තනතුරකට පත් කිරීමට.

03. 2002.02.28 දිනැති චක්‍රලේඛය අනුව Customer Services Co-ordinator - Grade III (New Post) තනතුරට පත් කිරීමට.

සහ කාරක සභාවේ තීන්දුව

01. තමාට 1998.11.09 සිට සාමාන්‍ය සේවා සහකාර V වන ශ්‍රේණියට උසස්වීම් දිය යුතුවුවද එය ලැබුනේ 2000.09.01 දින සිට බවත්, පාරිභෝගික සේවා සම්බන්ධීකාරක (Customer Services Co-ordinator - Grade III) තනතුර සඳහා පැවති පරීක්ෂණය අසමත්වීම සම්බන්ධයෙන් ද 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා තමාට වැඩි ශ්‍රේණියක රාජකාරී පැවරීම පිළිබඳව බේරුම්කරණයට යොමුකරන ලෙස දන්වා ඇතත් එය මෙතෙක් සිදු නොවීම යන කරුණු සම්බන්ධයෙන් සඳහන් කර පෙත්සම්කාරිය පාර්ලිමේන්තුවට පෙත්සම ඉදිරිපත් කර තිබුණි.

02. එහෙත් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය නියෝජනය කර සහභාගී වූ නිලධාරීන් සිදුකළ කරුණු දැක්වීම් අනුව 1998.11.09 දිනට V ශ්‍රේණියට උසස්වීම් සඳහා ඇයට සුදුසුකම් නොතිබූ බවත්, පාරිභෝගික සේවා සම්බන්ධීකාරක (Customer Services Co-ordinator - Grade III) තනතුර සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී ඇය අඩු ලකුණු ලැබීම මත එම තනතුර සඳහා තේරී පත්වී නොමැති බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

03. ඒ අනුව පෙත්සම්කාරියට ආයතනයෙන් අසාධාරණයක් සිදු වී නොමැති බවට කාරක සභාව තීරණය කළ අතර, ඇයට ලබාදිය හැකි වෙනත් සහනයක් නොමැති බැවින් පෙත්සමේ කටයුතු අවසන් කිරීමට කාරක සභාව තීරණය කරන ලදී.

04. ඒ අනුව පෙත්සමේ කටයුතු අවසන් කළ බව කාරක සභාවේ නියමය අනුව මෙයින් දන්වා සිටිමි.

ඉහත සඳහන් කරුණු සමඟ සලකා බැලීමේදී එනම් කාරක සභා තීන්දුවේ 02 වන ඡේදය, 03 වන ඡේදය සහ 04 වන ඡේදය සළකා බැලීමේදී පළමුවන පාර්ශ්වකරුගේ විසඳිය යුතු කරුණු හා බේරුම්කරණයෙන් විසඳිය යුතු කරුණු එක සමාන බැවින් ද දෙවන පාර්ශවකරුගේ විරෝධතාවය සම්බන්ධව ඉදිරිපත් කරන ලද නීතිමය සිද්ධාන්තය වන ''කිසිදු පුද්ගලයෙකුට එකම නිමිත්ත සම්බන්ධයෙන් සහන පතා එකම අවස්ථාවකදී පරීක්ෂණ දෙකක් සඳහා ඉල්ලීම කර පෙනී සිටිය නොහැකි බව'' හේතුව උඩ පළමුවන පාර්ශ්වකාරියට බේරුම්කරණය ඉදිරියට ගෙනයාමට ඉඩ නැත.

සියලු කරුණු සලකා බැලීමේදී පළමුවන පාර්ශ්වකාරියට මේ නඩුව ඉදිරියට ගෙනයාමට ඉඩ නැත. පළමුවන පාර්ශ්වකාරිය මහජන පෙත්සම් කාරක සභාවට කරුණු ඉදිරිපත් කළ නිසා එකී නීතිමය සිද්ධාන්තය අනුව එක නඩු නිමිත්තක් එක ආයතනයකට පමණක් නඩු ගෙන යාමට ඉඩඇති නිසා ඒ සම්බන්ධයෙන් පළමුවන පාර්ශ්වකාරියට නීතිමය තත්ත්වය උල්ලංඝණය කිරීම නිසා සහනයක් නිකුත් කිරීමට ඉඩ නොමැත.

ඒ අනුව නඩුව අවසන් කරමි. ප්‍රදානය නොකරමි.

මෙම ප්‍රදානය සාධාරණ බව මගේ නිගමනය වේ.

ටී. ඒ. සාන්තරාජන්,
බේරුම්කරු.

2017.01.27 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

05-123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.